Lesson 70 **Just a little too late**

මදක් ප්‍රමාදව

The message appeared on his phone just after sunset
ද මෙසේජ් ඇපියරඩ් ඔන් හිස් ෆෝන් ජස්ට් ආෆ්ටර් සන්සෙට්
හිරු බැස යාමට ටික වේලාවකට පසු ඔහුගේ දුරකථනයට පණිවිඩයක් පැමිණියේය.

"You come to the festival site tonight. Let's meet there"
"යූ කම් ටු ද ෆෙස්ටිවල් සයිට් ටුනයිට්. ලෙට්'ස් මීට් දෙයා."
"ඔයා අද රෑ උත්සව භූමියට එන්න. අපි එතනදී හමුවෙමු."

He stared at the screen for several seconds before replying
හී ස්ටෙයා(ර්)ඩ් ඇට් ද ස්ක්‍රීන් ෆෝ සෙවරල් සෙකන්ඩ්ස් බිෆෝ රිප්ලයිං.
පිළිතුරු දීමට පෙර ඔහු තත්පර කිහිපයක් තිරය දෙස බලා සිටියේය.

"What time will you be there?"
"වට් ටයිම් විල් යූ බී දෙයා?"
"ඔයා එන්නේ කීයටද?"

"Around seven"
"අරවුන්ඩ් සෙවන්."
"හතට විතර."

"Okay, sure. I'll see you there. I'll call you once I arrive."
"ඕකේ, ෂුව(ර්). අයිල් සී යූ දෙයා. අයිල් කෝල් යූ වන්ස් අයි අරයිව්."
"හරි, ෂුවර්. එහෙනම් එතනදී හමුවෙමු. මං ආවම ඔයාට කෝල් කරන්නම්."

After sending the message, he leaned back in his chair and closed his eyes. After three long years, he was finally going to see her again. And he had flown nearly two thousand miles for this moment.

ආෆ්ට(ර්) සෙන්ඩිං ද මෙසේජ්, හී ලීන්ඩ් බැක් ඉන් හිස් චෙයා ඇන්ඩ් ක්ලෝස්ඩ් හිස් අයිස්. ආෆ්ට(ර්) ත්‍රී ලෝං ඉය(ර්)ස්, හී වෝස් ෆයිනලි ගොයිං ටු සී හ(ර්) අගේන්. ඇන්ඩ් හී හැඩ් ෆ්ලෝ(වි)න් නිය(ර්)ලි ටූ තවුසන්ඩ් මයිල්ස් ෆෝ දිස් මෝමන්ට්.

පණිවිඩය යැවූ පසු ඔහු පුටුවේ පිටුපසට බර වී ඇස් පියාගත්තේය. දීර්ඝ අවුරුදු තුනකට පසු ඔහු අවසානයේ ඇයව නැවත දැකීමට යමින් සිටියේය . ඒ මොහොත වෙනුවෙන් ඔහු සැතපුම් දෙදහසකට ආසන්න දුරක් ගුවනින් පැමිණ සිටියේය.

The first time they met had felt strangely unforgettable from the very beginning.
ද ෆ(ර්)ස්ට් ටයිම් දේ මෙට් හැඩ් ෆෙල්ට් ස්ට්‍රේන්ජ්ලි අන්ෆොගෙටබල් ෆ්‍රොම් ද වෙරි බිගිනිං.
ඔවුන් මුල්වරට හමුවූ මොහොත ආරම්භයේ සිටම පුදුම සහගත  ලෙස අමතක නොවන එකක් ලෙස දැනුණි.

She had arrived in his city with a group of friends on a week long tour. At that time, he had been working for a travel company, and he was the one responsible for organizing their journey.

ෂී හැඩ් අරයිව්ඩ් ඉන් හිස් සිටි විත් අ ගෲප් ඔෆ් ෆ්‍රෙන්ඩ්ස් ඔන් අ වීක් ලෝං ටුව(ර්). ඇට් දැට් ටයිම්, හී හැඩ් බීන් ව(ර්)කිං ෆෝ  අ ට්‍රැවල් කම්පනි, ඇන්ඩ් හී වෝස් ද වන් රිස්පොන්සිබල් ෆෝ  ඕගනයිසිං දෙයා ජ(ර්)නි.

ඇය සතියක සංචාරයක් සඳහා මිතුරන් කණ්ඩායමක් සමඟ ඔහුගේ නගරයට පැමිණ තිබුණි . ඒ කාලයේ ඔහු සංචාරක සමාගමක සේවය කරමින් සිටි අතර, ඔවුන්ගේ ගමන සංවිධානය කිරීමේ වගකීම තිබුණේ ඔහුටය.

On the morning they arrived, he had gone to the airport personally to welcome the group and make sure everything was properly arranged.

ඔන් ද මෝනිං දේ අරයිව්ඩ්, හී හැඩ් ගෝන් ටු දි එයාපෝට් ප(ර්)සනලි ටු වෙල්කම් ද ගෲප් ඇන්ඩ් මේක් ෂුව(ර්) එව්රිතිං වෝස් ප්‍රොප(ර්)ලි ඇරෙන්ජ්ඩ්

ඔවුන් පැමිණි  උදෑසන, කණ්ඩායම පිළිගැනීමටත් සියල්ල නිසි ලෙස සූදානම් කර ඇති බව තහවුරු කරගැනීමටත් ඔහු පෞද්ගලිකවම ගුවන්තොටුපළට ගොස් තිබුණි.

That was when he first saw her.
දැට් වෝස් වෙන් හී ෆ(ර්)ස්ට් සෝ හ(ර්).
ඔහු ඇයව මුල්වරට දුටුවේ එවිටය.

Even before he approached them, she had already been looking at him. Their eyes met for a brief second. She immediately looked away, lowering her eyes with a shy smile that silently said more than words ever could.

ඊවන් බිෆෝ හී අප්‍රෝච්ඩ් දෙම්, ෂී හැඩ් ඕල්රෙඩි බීන් ලුකිං ඇට් හිම්. දෙයා අයිස් මෙට් ෆෝ  අ බ්‍රීෆ් සෙකන්ඩ්. ෂී ඉමීඩියට්ලි ලුක්ඩ් අවේ, ලෝවරිං හ(ර්) අයිස් විත් අ ෂයි ස්මයිල් දැට් සයිලන්ට්ලි සේඩ් මෝ දැන් ව(ර්)ඩ්ස් එව(ර්) කුඩ්.

ඔහු ඔවුන් වෙත ළං වීමටත් පෙරම , ඇය  ඔහු දෙස බලා සිටියාය. ඔවුන්ගේ දෑස් කෙටි මොහොතකට හමු විය.  තම දෑස් පහළට යොමු කරමින්ඇය වහා ඉවත බැලුවේ  වචනවලටත් වඩා බොහෝ දේ නිහඬව පවසන ලැජ්ජාශීලී සිනාවක් සමගිනි

Something about that moment remained with him. Yet after they parted , there was only silence  between them. He was too proud to chase after her. And she never tried to chase him either.

සම්තිං අබවුට් දැට් මෝමන්ට් රිමේන්ඩ් විත් හිම්..යෙට් ආෆ්ට(ර්) දේ  පාටඩ් , දෙයා වෝස් ඔන්ලි සයිලන්ස්  බිට්වීන් දෙම්. හී වෝස් ටූ ප්‍රවුඩ් ටු චේස් ආෆ්ට(ර්) හ(ර්). ඇන්ඩ් ෂී නෙව(ර්) ට්‍රයිඩ් ටු චේස් හිම් ඊද(ර්).

ඒ මොහොත ගැන යමක් ඔහුගේ හිත තුළ සදාකාලිකවම රැඳී තිබුණි. එහෙත්  ඔවුන් වෙන් වූ  පසු, ඔවුන් අතර තිබුනේ  නිහඬතාවයක් පමණි .ඔහු ඇය පසුපස හඹා යාමට තරම් අහංකාර වැඩි විය. ඇයද ඔහුව හඹා යාමට කිසිවිටෙක උත්සාහ නොකළාය. (part -  වෙන් වෙනවා )

For nearly a two and a half years, they heard nothing from each other. Then one day, a mutual friend unexpectedly reopened the door between them.

ෆෝ  නියර්(ර්)ලි අ ටූ ඇන්ඩ් අ හාෆ්  ඉය(ර්)ස් , දේ හ(ර්)ඩ් නතිං ෆ්‍රොම් ඉච් අද(ර්). දෙන් වන් ඩේ, අ මියුචුවල් ෆ්‍රෙන්ඩ් අන්එක්ස්පෙක්ටඩ්ලි රීඕපන්ඩ් ද ඩෝ බිට්වීන් දෙම්

වසර දෙකහමාරකට  ආසන්න කාලයක් ඔවුන් අතර කිසිඳු සන්නිවේදනයක් නොතිබුණි . පසුව එක් දිනක, පොදු මිතුරෙකු අනපේක්ෂිත ලෙස ඔවුන් අතර තිබූ දොර නැවත විවෘත කළේය.

“She asked me to give her regards to you,” the friend said casually. “She’d like to hear from you again.”

“ෂී ආස්ක්ට් මී ටු ගිව් හ(ර්) රිගාඩ්ස් ටු යූ,” ද ෆ්‍රෙන්ඩ් සේඩ් කැෂුවලි. “ෂී’ඩ් ලයික් ටු හිය(ර්) ෆ්‍රොම් යූ අගේන්.”

“ඇය මගෙන් ඉල්ලුවා  ඔබට සුබ පැතුම් දෙන්න  කියා ,” මිතුරා විශේෂත්වයක් නොමැතිව  කීවේය. “ඇය සතුටු වේවි ඔයාගෙන්  නැවත ඇමතුමක් ලබන්න  ”

That single message changed everything. Soon they were talking almost every day.
දැට් සිංගල් මෙසේජ් චේන්ජ්ඩ් එව්රිතිං.සූන් දේ ව(ර්) ටෝකිං ඕල්මෝස්ට් එව්රිඩේ.
එම එකම පණිවිඩය සියල්ල වෙනස් කළේය.කෙටි කලකින් ඔවුන් සෑම දිනකම පාහේ කතා කරන්නට පටන් ගත්හ

The conversations grew longer and warmer with time. They exchanged photographs constantly, joked endlessly, and shared the smallest details of their daily lives. She sent him pictures of her meals, the streets she walked through, the places she visited, and even random moments from ordinary days.

ද කන්ව(ර්)සේෂන්ස් ග්‍රෑව් ලෝංග(ර්) ඇන්ඩ් වෝම(ර්) විත් ටයිම්. දේ එක්ස්චේන්ජ්ඩ් ෆොටෝග්‍රාෆ්ස් කන්ස්ටන්ට්ලි, ජෝක්ඩ් එන්ඩ්ලස්ලි, ඇන්ඩ් ෂෙය(ර්)ඩ් ද ස්මෝලස්ට් ඩීටේල්ස් ඔෆ්

දෙය(ර්) ඩේලි ලයිව්ස්. ෂී සෙන්ට් හිම් පික්ච(ර්)ස් ඔෆ් හ(ර්) මීල්ස්, ද ස්ට්‍රීට්ස් ෂී වෝක්ඩ් තෲ, ද ප්ලේසස් ෂී විසිටඩ්, ඇන්ඩ් ඊවන් රැන්ඩම් මෝමන්ට්ස් ෆ්‍රොම් ඕඩිනරි ඩේස්.

ඔවුන්ගේ කතාබහ කාලයත් සමඟ දිගු හා උණුසුම් විය. ඔවුන් නිතරම ඡායාරූප හුවමාරු කරගත්හ, අඛණ්ඩව විහිළු කළහ, සහ තම දෛනික ජීවිතයේ ඉතා කුඩා විස්තර පවා බෙදාගත්හ. ඇය තම ආහාර, ඇවිද ගිය වීදි, ගිය ස්ථාන, සහ සාමාන්‍ය දිනවල අහඹු මොහොත වල පවා පින්තූර ඔහුට යැව්වාය (ordinary- ඕඩිනරි - සාමාන්‍ය)

Without realizing it, she became part of his everyday life. And his feelings for her deepened beyond control. She knew it too.

විතවුට් රියලයිසිං ඉට්, ෂී බිකේම් පාට් ඔෆ් හිස් එව්රිඩේ ලයිෆ්. ඇන්ඩ් හිස් ෆීලිංග්ස් ෆෝ හ(ර්) ඩීපන්ඩ් බියොන්ඩ් කන්ට්‍රෝල්. ෂී නිව් ඉට් ටූ.

ඔහුට නොදැනීම, ඇය ඔහුගේ දෛනික ජීවිතයේ කොටසක් බවට පත් විය. ඒ අතර ඇය පිළිබඳ ඔහුගේ හැඟීම් පාලනයෙන් තොරව තව තවත් ගැඹුරු විය.ඇයද එය දැන සිටියාය.

It was obvious in the way he spoke to her, in the attention he gave her, and in the quiet affection hidden beneath every conversation.

ඉට් වෝස් ඔබ්වියස් ඉන් ද වේ හී ස්පෝක් ටු හ(ර්), ඉන් ද අටෙන්ෂන් හී ගේව් හ(ර්), ඇන්ඩ් ඉන් ද ක්වයට් අෆෙක්ෂන් හිඩින් බිනීත් එව්රි කන්ව(ර්)සේෂන්.

ඔහු ඇය සමඟ කතා කරන ආකාරයෙන්, ඇයට දක්වන අවධානයෙන්, සහ සෑම කතාබහකම යටින් සැඟවී තිබූ නිහඬ ආදරයෙන් එය පැහැදිලිව පෙනුණි.

Yet he never directly confessed his love. He wanted to do it properly. He wanted to stand before her in person and tell her everything face to face.

යෙට් හී නෙව(ර්) ඩිරෙක්ට්ලි කන්ෆෙස්ඩ් හිස් ලව්. හී වෝන්ටඩ් ටු ඩූ ඉට් ප්‍රොප(ර්)ලි. හී වෝන්ටඩ් ටු ස්ටෑන්ඩ් බිෆෝ(ර්) හ(ර්) ඉන් ප(ර්)සන් ඇන්ඩ් ටෙල් හ(ර්) එව්රිතිං ෆේස් ටු ෆේස්.

එහෙත් ඔහු කිසිදා සෘජුවම තම ආදරය ප්‍රකාශ කළේ නැත. ඔහුට එය නිසි ලෙස කිරීමට අවශ්‍ය විය. ඔහුට ඇය ඉදිරියේම සිට සියල්ල මුහුණට මුහුණ කියන්නට අවශ්‍ය විය.

After six months of this online romance , he finally decided to visit her city
ආෆ්ට(ර්) සික්ස් මන්ත්ස් ඔෆ් දිස් ඔන්ලයින් රොමෑන්ස් , හී ෆයිනලි ඩිසයිඩඩ් ටු විසිට් හ(ර්) සිටි
මේ ඔන්ලයින් ප්‍රේමයේ මාස හයකට පසු, ඔහු අවසානයේ ඇගේ නගරයට පැමිණීමට තීරණය කළේය.

Before leaving, he hinted at the true purpose of his journey. But her reply shattered him.
බිෆෝ(ර්) ලීවිං, හී හින්ටඩ් ඇට් ද තෲ ප(ර්)පස් ඔෆ් හිස් ජ(ර්)නි. බට් හ(ර්) රිප්ලයි ෂැට(ර්)ඩ් හිම්.

පිටත් වීමට පෙර, ඔහු තම ගමනේ සැබෑ අරමුණ ගැන ඉඟියක් ලබා දුන්නේය. නමුත් ඇගේ පිළිතුර ඔහුගේ හදවත බිඳ දැමීය.

Sorry, Shane… I have to confess now . When I first started talking to you, I was already in a relationship. At that time, things were uncertain between us. But now we've decided to move forward together.

"සොරි, ෂේන්… අයි හැව් ටු කන්ෆෙස් නව්. වෙන් අයි ෆස්ට් ස්ටා(ර්)ටඩ් ටෝකින් ටු යූ, අයි වෝස් ඕල්රෙඩි ඉන් අ රිලේෂන්ෂිප්. ඇට් දැට් ටයිම්, තිංග්ස් ව(ර්) අන්ස(ර්)ටින් බිට්වීන් අස්. බට් නව් වීව් ඩිසයිඩඩ් ටු මූව් ෆෝව(ර්)ඩ් ටුගෙද(ර්)."

"සොරි ෂේන්… මම දැන් ඔයාට ඇත්ත කියන්න ඕන . මං මුලින්ම ඔයා එක්ක කතා කරන්න පටන් ගන්නකොටත් මං වෙන කෙනෙක් එක්ක සම්බන්ධතාවයක හිටියේ. ඒ කාලේ අපි අතර අවිනිශ්චිත බවක් තිබුනා . ඒත් දැන් අපි ඉස්සරහට යන්න තීරණය කරලා තියෙනවා."

He stared at the message for a long time. His chest tightened painfully. Still, he forced himself to reply calmly.

හී ස්ටෙය(ර්)ඩ් ඇට් ද මෙසේජ් ෆෝ අ ලෝං ටයිම්. හිස් චෙස්ට් ටයිටන්ඩ් පේන්ෆුලි. ස්ටිල්, හී ෆෝස්ඩ් හිම්සෙල්ෆ් ටු රිප්ලයි කාම්ලි.

ඔහු දිගු වේලාවක් පණිවිඩය දෙස බලා සිටියේය. ඔහුගේ පපුව වේදනාවෙන් දැඩි විය. එහෙත් ඔහු සන්සුන්ව පිළිතුරු දීමට තමාටම බල කළේය.

It's okay. I'll come anyway. I want to see the festival in your city.

"ඉට්ස් ඕකේ. අයිල් කම් එනිවේ. අයි වෝන්ට් ටු සී ද ෆෙස්ටිවල් ඉන් යුව(ර්) සිටි."

"කමක් නැහැ. මං කොහොමත් එනවා . මට ඔයාගේ නගරේ තියෙන උත්සවය බලන්න ඕනේ."

But deep inside, he refused to believe her words completely. She had always been honest with him. She was not the type of woman who played games with people's feelings.

බට් ඩීප් ඉන්සයිඩ්, හී රිෆියුස්ඩ් ටු බිලීව් හ(ර්) ව(ර්)ඩ්ස් කම්ප්ලීට්ලි. ෂී හැඩ් ඕල්වේස් බීන් ඔනස්ට් විත් හිම්. ෂී වෝස් නොට් ද ටයිප් ඔෆ් වුමන් හූ ප්ලේඩ් ගේම්ස් විත් පීපල්ස් ෆීලින්ග්ස්.

නමුත් ඔහුගේ හිතේ ගැඹුරින්ම, ඇගේ වචන සම්පූර්ණයෙන් විශ්වාස කිරීමට ඔහු කැමති වූයේ නැත. ඇය සැමවිටම ඔහු සමඟ අවංක වූවාය . ඇය මිනිසුන්ගේ හැඟීම් සමඟ සෙල්ලම් කරන වර්ගයේ කාන්තාවක් නොවීය.

Maybe she was only testing him. Maybe she was afraid. Maybe women simply said such things when they sensed a man getting too close. That tiny hope continued burning inside him.

මේ බී ෂී වෝස් ඔන්ලි ටෙස්ටිං හිම්. මේ බී ෂී වෝස් අෆ්‍රේඩ්. මේ බී විමෙන් සිම්ප්ලි සේඩ් සච් තිංග්ස් වෙන් දේ සෙන්ස්ඩ් අ මෑන් ගෙටිං ටූ ක්ලෝස්. දැට් ටයිනි හෝප් කන්ටිනියුඩ් බ(ර්)නිං ඉන්සයිඩ් හිම්.

සමහරවිට ඇය ඔහුව පරීක්ෂා කරමින් සිටියා විය හැක. සමහරවිට ඇය බිය වී සිටියා විය හැක. ඇතැම් විට කාන්තාවන් පිරිමියෙකු තමන්ට වැඩියෙන් ළං වන බව දැනුණු විට මෙවැනි දේවල් කියනවා විය හැක. ඒ පුංචි බලාපොරොත්තුව තවමත් ඔහු තුළ දැවෙමින් තිබුණි.

The festival grounds were overflowing with lights, music, and crowds when he arrived that night. A message from her appeared moments later.

ද ෆෙස්ටිවල් ග්‍රවුන්ඩ්ස් ව(ර්) ඕව(ර්)ෆ්ලෝවිං විත් ලයිට්ස්, මියුසික්, ඇන්ඩ් ක්‍රවුඩ්ස් වෙන් හී අරයිව්ඩ් දැට් නයිට්. අ මෙසේජ් ෆ්‍රොම් හ(ර්) අපියර්)ඩ් මෝමන්ට්ස් ලේට(ර්).

ඔහු එදා රාත්‍රියේ එහි පැමිණෙන විට උත්සව භූමිය විදුලි ආලෝක, සංගීතය සහ ජනකායෙන් පිරී ඉතිරී ගොස් තිබුණි. මොහොතකට පසු ඇගෙන් පණිවිඩයක් පැමිණියේය.

I’m watching the musical performance. I’m sitting near the back of the tent.

“අයිම් වොචිං ද මියුසිකල් ප(ර්)ෆෝමන්ස්. අයිම් සිටිං නියර්) ද බැක් ඔෆ් ද ටෙන්ට්.”

“මං සංගීත ප්‍රසංගය බලන ගමන් . මං ටෙන්ට් එකේ පිටිපස්ස පැත්තට වෙන්න ඉන්නේ.”

His heartbeat quickened. He walked quietly behind the large tent and carefully scanned the audience. Then he saw her.

හිස් හාට්බීට් ක්වික්න්ඩ්. හී වෝක්ට් ක්වයට්ලි බිහයින්ඩ් ද ලා(ර්)ජ් ටෙන්ට් ඇන්ඩ් කෙයාෆුලි ස්කෑන්ඩ් දි ඕඩියන්ස්. දෙන් හී සෝ හ(ර්).

ඔහුගේ හෘද ස්පන්දනය වේගවත් විය. ඔහු නිහඬව විශාල කූඩාරම පිටුපසින් ගොස් ප්‍රේක්ෂකයන් හොඳින් පිරිස්සා බැලීය. එවිට ඔහු ඇයව දුටුවේය.

For a few seconds, he simply stood there staring at her. She seemed deeply absorbed in the music, so he decided not to interrupt her. Instead, he sent her a message.

ෆෝ අ ෆිව් සෙකන්ඩ්ස්, හී සිම්ප්ලි ස්ටුඩ් දෙයා ස්ටෙය(ර්)රිං ඇට් හ(ර්). ෂී සීම්ඩ් ඩීප්ලි අබ්සෝ(ර්)බ්ඩ් ඉන් ද මියුසික්, සෝ හී ඩිසයිඩඩ් නොට් ටු ඉන්ටරප්ට් හ(ර්). ඉන්ස්ටෙඩ්, හී සෙන්ට් හ(ර්) අ මෙසේජ්.

තත්පර කිහිපයක් ඔහු එතැනම සිටගෙන ඇය දෙස බලා සිටියේය. ඇය සංගීතයට ගැඹුරින්ම සමවැදී සිටින බව පෙනුණි , ඔහු ඇයට බාධා නොකිරීමට තීරණය කළේය. ඒ වෙනුවට ඔහු ඇයට පණිවිඩයක් යැවීය.

Enjoy the show. I'll wait for you near the food corner.
"එන්ජෝයි ද ෂෝ. අයිල් වේට් ෆෝ යූ නියර්(ර්) ද ෆුඩ් කෝනර්(ර්)."
"ප්‍රසංගය රසවිඳින්න. මං කෑම තියෙන පැත්තේ ඔයා එනකල් ඉන්නම්."

As he walked away through the crowd to the food corner, he suddenly heard someone shouting behind him.
"Shane! Shane!"

ඇස් හී වෝක්ට් අවේ ත්‍රෲ ද ක්‍රවුඩ් ටු ද ෆුඩ් කෝන(ර්), හී සඩ්න්ලි හ(ර්)ඩ් සම්වන් ෂවුටිං බිහයින්ඩ් හිම්.
"ෂේන්! ෂේන්!"

ඔහු ජනකාය අතරින් කෑම කඩය දෙසට ඇවිදගෙන යන අතරතුර, හදිසියේම පිටුපසින් කෙනෙකු කෑගසන හඬක් ඔහුට ඇසුණි.
"ෂේන්! ෂේන්!"

Even before turning around, he knew it was her. When he looked back, he saw her hurrying toward him through the crowd. He turned back and slowly walked toward her too.

ඊවන් බිෆෝ(ර්) ට(ර්)නිං අරවුන්ඩ්, හී නිව් ඉට් වෝස් හ(ර්). වෙන් හී ලුක්ට් බැක්, හී සෝ හ(ර්) හරීං ටුවෝ(ර්)ඩ් හිම් ත්‍රෲ ද ක්‍රවුඩ්. හී ට(ර්)න්ඩ් බැක් ඇන්ඩ් ස්ලෝලි වෝක්ට් ටුවෝ(ර්)ඩ් හ(ර්) ටූ.

පිටුපස හැරීමටත් පෙර, ඒ ඇය බව ඔහු දැනගත්තේය. ඔහු පිටුපස බැලූ විට, ඇය ජනකාය අතරින් ඔහු දෙසට ඉක්මනින් ඇවිද එන අයුරු දුටුවේය. ඔහුද සෙමින් ඇය දෙසට ඇවිද ගියේය.

She smiled and said, "I saw you walking this way." Then he gently held out his hand. She immediately took it. The warmth of her fingers sent a strange feeling through his chest.

ෂී ස්මයිල්ඩ් ඇන්ඩ් සෙඩ්, "අයි සෝ යූ වෝකිං දිස් වේ." දැන් හී ජෙන්ට්ලි හෙල්ඩ් අවුට් හිස් හෑන්ඩ්. ෂී ඉමීඩියට්ලි ටුක් ඉට්. ද වෝම්ත් ඔෆ් හ(ර්) ෆිංග(ර්)ස් සෙන්ට් අ ස්ට්‍රේන්ජ් ෆීලිං ත්‍රෲ හිස් චෙස්ට්.

ඇය සිනාසෙමින්, "ඔයා මේ පැත්තට එනවා මං දැක්කා," යැයි කීවාය. ඉන්පසු ඔහු මෘදු ලෙස තම අත දිගු කළේය. ඇය වහාම එය ග්‍රහණය කරගත්තාය . ඇගේ අතැඟිලිවල උණුසුම ඔහුගේ පපුව තුළ අමුතු හැඟීමක් ඇති කළේය.

Together they walked toward the food corner beneath the glowing festival lights. He asked about her favorite food and ordered it . They sat across from each other talking softly while music filled the night air.

ටුගෙද(ර්) දේ වෝක්ට් ටුවෝ(ර්)ඩ් ද ෆුඩ් කෝන(ර්) බිනීත් ද ග්ලෝවිං ෆෙස්ටිවල් ලයිට්ස්. හී ආස්ක්ට් අබවුට් හ(ර්) ෆේවරිට් ෆුඩ් ඇන්ඩ් ඕ(ර්)ඩ(ර්)ඩ් ඉට්. දේ සැට් අක්‍රොස් ෆ්‍රොම් ඊච් අද(ර්) ටෝකිං සොෆ්ට්ලි වයිල් මියුසික් ෆිල්ඩ් ද නයිට් එයා(ර්)

ඔවුන් දෙදෙනා දීප්තිමත් උත්සව ආලෝක යටින් ෆුඩ් කෝන(ර්) දෙසට ඇවිද ගියහ. ඔහු ඇගේ ප්‍රියතම කෑම ගැන අසා එය ඇයට ඇණවුම් කළේය. රාත්‍රී ගුවන සංගීතයෙන් පිරී යද්දී ඔවුන් එකිනෙකාට මුහුණලා හිඳගෙන මෘදු හඬින් කතා කළහ

Though she was usually energetic and outspoken, tonight she spoke almost like a shy little girl. There was tenderness in her voice, a softness he had never seen before.

දෝ ෂී වෝස් යූෂුවලි එන(ර්)ජෙටික් ඇන්ඩ් අවුට්ස්පෝකන්, ටුනයිට් ෂී ස්පෝක් ඕල්මෝස්ට් ලයික් අ ෂයි ලිට්ල් ග(ර්)ල්. දෙයා වෝස් ටෙන්ඩ(ර්)නස් ඉන් හ(ර්) වොයිස්. අ සොෆ්ට්නස් හී හැඩ් නෙව(ර්) සීන් බිෆෝ(ර්).

සාමාන්‍යයෙන් ජවසම්පන්නව සහ නොවලහා කතා කරන ඇය, එදා රාත්‍රියේ කතා කළේ ලැජ්ජාශීලී පුංචි ගැහැණු ළමයෙකු මෙනි . ඇගේ කටහඬේ සෞම්‍ය ගතියක් තිබුණි, ඔහු මීට පෙර කිසිදා නොදුටු මෘදු බවක් (outspoken - අවුට්ස්පෝකන් - කෙලින් / විවෘතව කතා කරන)

At one point, he lifted his phone and took a selfie of them together. She leaned close beside him, almost resting against his shoulder. When he looked at the photograph afterward, they looked like a newly married couple.

ඇට් වන් පොයින්ට්, හී ලිෆ්ටඩ් හිස් ෆෝන් ඇන්ඩ් ටුක් අ සෙල්ෆි ඔෆ් දෙම් ටුගෙද(ර්). ෂී ලීන්ඩ් ක්ලෝස් බිසයිඩ් හිම්, ඕල්මෝස්ට් රෙස්ටිං අගෙන්ස්ට් හිස් ෂෝල්ඩ(ර්). වෙන් හී ලුක්ඩ් ඇට් ද ෆොටෝග්‍රාෆ් ආෆ්ට(ර්)ව(ර්)ඩ්, දේ ලුක්ඩ් ලයික් අ නිව්ලි මැරිඩ් කප්ල්.

එක් අවස්ථාවක ඔහු තම දුරකථනය ඉහළට ඔසවා ඔවුන් දෙදෙනාගේ සෙල්ෆියක් ගත්තේය. ඇය ඔහුට ඉතා ළංව ඔහුගේ උරහිසට හේත්තු වන තරම් සමීපව සිටියාය. පසුව ඔහු ඡායාරූපය බැලූ විට, ඔවුන් අලුත විවාහ වූ යුවළක් මෙන් පෙනුණි.

Finally, gathering his courage, he decided to ask the question that had been haunting him.
“So… when are you getting married?”

ෆයිනලි, ගැදරිං හිස් කරේජ්, හී ඩිසයිඩඩ් ටු ආස්ක් ද ක්වෙස්ෂන් දැට් හැඩ් බීන් හෝන්ටිං හිම්.
“සෝ… වෙන් ආ(ර්) යූ ගෙටිං මැරිඩ්?”

අවසානයේ, තම ධෛර්යය එකතු කරගෙන, තම සිතේ හොල්මන් කරමින් සිටි ප්‍රශ්නය ඇසීමට තීරණය කළේය.
“ඉතින්… ඔයා කවදාද විවාහ වෙන්නේ?”

She lowered her eyes briefly.
“Probably within a few months,” she answered quietly. “I’ll tell you everything tomorrow. Please come to my apartment for lunch. I’ll cook for you.”

ෂී ලෝව(ර්)ඩ් හ(ර්) අයිස් බ්‍රීෆ්ලි.
“ප්‍රොබබ්ලි විතින් අ ෆිව් මන්ත්ස්,” ෂී ආන්ස(ර්)ඩ් ක්වයට්ලි. “අයිල් ටෙල් යූ එව්රිතිං ටුමොරෝ. ප්ලීස් කම් ටු මයි අපා(ර්)ට්මන්ට් ෆෝ ලන්ච්. අයිල් කුක් ෆෝ යූ.”

ඇය මොහොතකට ඇගේ නෙත් පහත හෙළුවාය
“සමහරවිට තවත් මාස කිහිපයකින්,” ඇය නිහඬව පිළිතුරු දුන්නාය. “හෙට මං ඔයාට හැමදේම කියන්නම්. කරුණාකරලා ලන්ච් එකට මගේ අපාට්මන්ට් එකට එන්න. මං ඔයාට උයන්නම්.”

“Sure,” he replied gently. “Thank you for inviting me.”
“No mention,” she said with a faint smile.

“ෂුව(ර්),” හී රිප්ලයිඩ් ජෙන්ට්ලි. “තැන්ක් යූ ෆෝ ඉන්වයිටිං මී.”
“නෝ මෙන්ෂන්,” ෂී සෙඩ් විත් අ ෆේන්ට් ස්මයිල්.

“හරි,” ඔහු මෘදු ලෙස පිළිතුරු දුන්නේය. “මට ආරාධනා කළාට ස්තූතියි.”
“ඕකට ස්තුතී කරන්න ඕන නැහැ ” ඇය මඳ සිනාවකින් කීවාය. (faint - ෆේන්ට් - මඳ , සිහින් , යන්තම් )

Later, they slowly walked toward the exit of the carnival grounds together. His heart was filled with a feeling he could neither understand nor explain. Just before reaching the road, she suddenly stopped.

ලේට(ර්), දේ ස්ලෝලි වෝක්ට් ටුවෝ(ර්)ඩ් ද එක්සිට් ඔෆ් ද කානිවල් ග්‍රවුන්ඩ්ස් ටුගෙද(ර්). හිස් හාට් වෝස් ෆිල්ඩ් විත් අ ෆීලිං හී කුඩ් නයිද(ර්) අන්ඩ(ර්)ස්ටෑන්ඩ් නෝ(ර්) එක්ස්ප්ලේන්. ජස්ට් බිෆෝ(ර්) රීචිං ද රෝඩ්, ෂී සඩ්න්ලි ස්ටොප්ඩ්.

පසුව ඔවුන් දෙදෙනා කානිවල් භූමියේ පිටවීමේ දොරටුව දෙසට සෙමින් ඇවිද ගියහ. ඔහුගේ හදවත ඔහුට තේරුම් ගත හෝ පැහැදිලි කළ නොහැකි හැඟීමකින් පිරී තිබුණි. පාරට ළඟාවීමට මොහොතකට පෙර, ඇය හදිසියේම නතර වූවාය.

“Shane… can we take another photo here?”
“ෂේන්… කැන් වී ටේක් අනද(ර්) ෆොටෝ හියර්(ර්)?”
“ෂේන්… අපිට මෙතන තවත් ෆොටෝ එකක් ගන්න පුළුවන්ද?”

They stood beneath the festival lights and took several more photographs together. But this time, the smiles on their faces looked sadder somehow.

දේ ස්ටූඩ් බිනීත් ද ෆෙස්ටිවල් ලයිට්ස් ඇන්ඩ් ටුක් සෙවරල් මෝ ෆොටෝග්‍රාෆ්ස් ටුගෙද(ර්).
බට් දිස් ටයිම්, ද ස්මයිල්ස් ඔන් දෙයා(ර්) ෆේසස් ලුක්ට් සෑඩ(ර්) සම්හව්.

ඔවුන් උත්සව ආලෝක යටින් සිටගෙන තවත් ඡායාරූප කිහිපයක් එකට ගත්හ.
නමුත් මෙවර, ඔවුන්ගේ මුහුණුවල තිබූ සිනහවන් තුල  දුක්බර බවක් පෙනුනි

That night, sleep never came easily. His thoughts moved endlessly in circles. What was she going to tell him tomorrow? Was there still hope hidden somewhere beneath her words? Or was he walking directly toward heartbreak?

දැට් නයිට්, ස්ලීප් නෙව(ර්) කේම් ඊසිලි. හිස් තෝට්ස් මූව්ඩ් එන්ඩ්ලස්ලි ඉන් ස(ර්)කල්ස්. වට් වෝස් ෂී ගොයිං  ටු ටෙල් හිම් ටුමොරෝ? වෝස් දෙයා ස්ටිල් හෝප් හිඩ්න් සම්වෙයා බිනීත් හ(ර්) ව(ර්)ඩ්ස්? ඕ වෝස් හී වෝකිං ඩිරෙක්ට්ලි ටුවෝඩ් හාට්බ්‍රේක්?

එදා රාත්‍රියේ ඔහුට පහසුවෙන් නින්ද ගියේ නැත. ඔහුගේ සිතුවිලි නිමක් නොමැතිව  කැරකෙමින් තිබුණි. හෙට ඇය ඔහුට කියන්න යන්නේ කුමක්ද? ඇගේ වචන යට කොතැනක හෝ තවමත් බලාපොරොත්තුවක් සැඟවී තිබේද? නැත්නම් ඔහු සෘජුවම හිත් බිඳුමක් කරා  ගමන් කරමින් සිටියේද ?

The next afternoon, he arrived at her apartment carrying the nervousness of a man awaiting his final judgment.

ද නෙක්ස්ට් ආෆ්ට(ර්)නූන්, හී අරයිව්ඩ් ඇට් හ(ර්) අපා(ර්)ට්මන්ට් කැරිං  ද න(ර්)වස්නස් ඔෆ් අ මෑන් අවේටිං හිස් ෆයිනල් ජජ්මන්ට්.

ඊළඟ දහවල් ඔහු ඇගේ අපාට්මන්ට් එකට පැමිණියේ, අවසන් තීන්දුව අපේක්ෂිතව  සිටින මිනිසෙකුගේ නොසන්සුන්තාවය සමඟිනි.

She welcomed him warmly. While preparing lunch in the kitchen, she slowly began telling him the truth about her life.

ෂී වෙල්කම්ඩ් හිම් වෝම්ලි. වයිල් ප්‍රිපෙයරිං ලන්ච් ඉන් ද කිචන්, ෂී ස්ලෝලි බිගෑන් ටෙලිං හිම් ද ට්‍රූත් අබවුට් හ(ර්) ලයිෆ්.

ඇය ඔහුව උණුසුම් ලෙස පිළිගත්තාය. කුස්සියේ දිවා ආහාරය සූදානම් කරන අතරතුර, ඇය තම ජීවිතයේ සත්‍යය සෙමින් ඔහුට කියන්න පටන් ගත්තාය.

Behind her cheerful personality, there were hidden years of silent suffering. Her life had been filled with exhaustion, financial struggles, and responsibilities far heavier than he had ever imagined. She had been working two jobs at the same time, barely finding enough time to rest.

බිහයින්ඩ් හ(ර්) චියර්)ෆුල් ප(ර්)සනෑලිටි  දෙයා(ර්) ව(ර්) ඉය(ර්)ස් ඔෆ් සයිලන්ට් සෆරිං. හ(ර්) ලයිෆ් හැඩ් බීන් ෆිල්ඩ් විත් එග්සෝස්ෂන්, ෆයිනෑන්ෂල් ස්ට්‍රගල්ස්, ඇන්ඩ් රිස්පොන්සිබිලිටීස් ෆා හෙවියර්) දැන් හී හැඩ් එව(ර්) ඉමැජින්ඩ්. ෂී හැඩ් බීන් ව(ර්)කිං ටූ ජොබ්ස් ඇට් ද සේම් ටයිම්, බෙයා(ර්)ලි ෆයින්ඩිං ඉනෆ් ටයිම් ටු රෙස්ට්.

ඇගේ සතුටින් පිරුණු පෞරුෂය පිටුපස වසර ගණනාවක නිහඬ වේදනාවක් සැඟවී තිබුණි. ඇගේ ජීවිතය දැඩි  වෙහෙස, මූල්‍ය අරගල සහ ඔහු කිසිදා සිතා නොතිබූ තරම් බරපතළ වගකීම්වලින් පිරී තිබුණි. ඇය එකම වේලාවේ රැකියා දෙකක වැඩ කරමින්, විවේක ගැනීමටවත් ප්‍රමාණවත් කාලයක් සොයාගැනීමට නොහැකිව සිටියාය. (cheerful -චියර්ෆුල් - ප්‍රීතිමත් , ප්‍රබෝධමත් , ප්‍රසන්න )

As he listened to her story, his heart grew painfully heavy. He could hardly believe how much hardship she had suffered  alone

ඈස් හී ලිස්න්ඩ් ටු හ(ර්) ස්ටෝරි, හිස් හාට් ග්‍රෑව් පේන්ෆුලි හෙවි. හී කුඩ් හා(ර්)ඩ්ලි බිලීව් හව් මච් හාඩ්ෂිප් ෂී හෑඩ් සෆ(ර්)ඩ්  අලෝන්.

ඇගේ කතාවට සවන් දෙමින් සිටින විට, ඔහුගේ හදවත වේදනාවෙන් බර විය. ඇය තනිවම මෙතරම් දුක් කම්කටොළු විඳ ඇති බව ඔහුට විශ්වාස කිරීමටවත් අපහසු විය.

Then she spoke about the man she was going to marry. He was her boss at one of her workplaces, a stable, dependable man who could finally offer her security and peace after years of struggle. “She had no reason to reject him,” he realized silently.

දැන් ෂී ස්පෝක් අබවුට් ද මෑන් ෂී වෝස් ගොයිං ටු මැරි. හී වෝස් හ(ර්) බොස් ඇට් වන් ඔෆ් හ(ර්) ව(ර්)ක්ප්ලේසස් , අ ස්ටේබල්, ඩිපෙන්ඩබල් මෑන් හූ කුඩ් ෆයිනලි ඔෆ(ර්) හ(ර්) සිකියුරිටි ඇන්ඩ් පීස් ආෆ්ට(ර්) ඉය(ර්)ස් ඔෆ් ස්ට්‍රගල්. “ෂී හැඩ් නෝ රීසන් ටු රිජෙක්ට් හිම්,” හී රියලයිස්ඩ් සයිලන්ට්ලි.

ඉන්පසු ඇය විවාහ වීමට යන පුද්ගලයා ගැන කතා කළාය. ඔහු ඇය වැඩ කරන තැන්වලින් එකක ප්‍රධානියා විය , වසර ගණනාවක අරගලයකින් පසු ඇයට ආරක්ෂාව සහ සැනසීම ලබා දිය හැකි ස්ථාවර හා රඳා පැවතිය හැකි  මිනිසෙකි. “ඇයට ඔහුව ප්‍රතික්ෂේප කරන්න හේතුවක් තිබුණේ නැතැයි ” ඔහු නිහඬව තේරුම් ගත්තේය.

Whether she truly loved him or not no longer seemed to matter. For the first time, he fully understood her decision. And he could not hate her for it.

වෙද(ර්) ෂී ත්රෑලි ලව්ඩ් හිම් ඕ නොට් නෝ ලෝංග(ර්) සීම්ඩ් ටු මැට(ර්). ෆෝ  ද ෆස්ට් ටයිම්, හී ෆුලි අන්ඩ(ර්)ස්ටුඩ් හ(ර්) ඩිසිෂන්. ඇන්ඩ් ස්ට්‍රේන්ජ්ලි, හී කුඩ් නොට් හේට් හ(ර්) ෆෝ  ඉට්.

ඇය ඔහුට සැබවින්ම ආදරය කළාද නැද්ද යන්න තවදුරටත් අදාළ  බවක් නොපෙනුණි. පළමු වතාවට ඔහු ඇගේ තීරණය සම්පූර්ණයෙන්ම තේරුම් ගත්තේය.  ඒ වෙනුවෙන් ඇයට වෛර කිරීමටද ඔහුට නොහැක

At last, he slowly stood up to leave. She walked with him toward the door. Then, in a quiet voice filled with regret, she said, “I’m sorry, Shane… You came a little too late into my life.”

ඇට් ලාස්ට්, හී ස්ලෝ(ව් )ලි ස්ටූඩ් අප් ටු ලීව්. ෂී වෝක්ඩ් විත් හිම් ටුවෝ(ර්)ඩ් ද ඩෝ. දෙන් , ඉන් අ ක්වයට් වොයිස් ෆිල්ඩ් විත් රිග්‍රෙට්, ෂී සේඩ්, “අයිම් සොරි, ෂේන්… යූ කේම් අ ලිට්ල් ටූ ලේට් ඉන්ටු මයි ලයිෆ්.”

අවසානයේ ඔහු පිටව යාමට සෙමින් නැගී සිටියේය. ඇයද ඔහු සමඟ දොර දෙසට ඇවිද ආවාය . ඉන්පසු පසුතැවිලිලෙන් පිරුණු මඳ හඬකින් ඇය මෙසේ කීවාය, “මට සමාවෙන්න, ෂේන්… ඔයා මගේ ජීවිතයට ආවේ ටිකක් පරක්කු වෙලා ”

For a moment, he could not answer. Then he smiled gently.
“It’s okay, honey. I truly wish you the very best.”

ෆෝ අ මෝමන්ට්, හී කුඩ් නොට් ආන්ස(ර්). දෙන් හී ස්මයිල්ඩ් ජෙන්ට්ලි.
“ඉට්ස් ඕකේ, හනී . අයි ට්‍රෘලි විෂ් යූ ද වෙරි බෙස්ට්.”

මොහොතකට ඔහුට පිළිතුරු දීමට නොහැකි විය. ඉන්පසු ඔහු මෘදු ලෙස සිනාසුණේය.
“කමක් නැහැ . මං ඇත්තටම ඔයාට හොඳම දේ ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.”

Silence filled the room. A deep, aching silence. Finally, he looked at her and asked softly, “Can I hug you… and kiss you?”

සයිලන්ස් ෆිල්ඩ් ද රූම්. අ ඩීප්, ඒකිං සයිලන්ස්. ෆයිනලි, හී ලුක්ට් ඇට් හ(ර්) ඇන්ඩ් ආස්ක්ඩ් සොෆ්ට්ලි,
“කැන් අයි හග් යූ… ඇන්ඩ් කිස් යූ?”

කාමරය නිහඬතාවයෙන් පිරී ගියේය. ගැඹුරු, හදවත රිදවන නිහඬතාවයක්. අවසානයේ ඔහු ඇය දෙස බලා මෘදු ලෙස ඇසුවේය,
“මට ඔයාව වැළඳගෙන… කිස් එකක් දෙන්න පුළුවන්ද?”

Her eyes glistened suddenly “Oh yes,” she whispered.

හ(ර්) අයිස් ග්ලිස්න්ඩ් සඩ්න්ලි. “ඕහ් යෙස්,” ෂී විස්ප(ර්)ඩ්.

වහා ඇගේ දෑස් දිලිසුණි . “ඔව්…” ඇය මිමිණුවාය.

She embraced him tightly, almost like a little girl searching for comfort. Then she kissed him warmly on the cheek.

ෂී ඉම්බ්‍රේස්ඩ් හිම් ටයිට්ලි, ඕල්මෝස්ට් ලයික් අ ලිට්ල් ග(ර්)ල් ස(ර්)චිං ෆෝ කම්ෆ(ර්)ට්. දෙන් ෂී කිස්ඩ් හිම් වෝම්ලි ඔන් ද චීක්.

සැනසීමක් සොයන පුංචි ගැහැණු ළමයෙකු මෙන් ඇය  ඔහුව තදින් වැළඳ ගත්තාය. ඉන්පසු ඇය ඔහුගේ කම්මුල උණුසුම් ලෙස සිපගත්තාය.

When he leaned in a little lower to kiss her, his lips brushed a more sensitive spot—the side of her neck, just below her ear. Neither of them moved for a second. And somewhere deep inside him, he knew that moment would remain with him forever.

වෙන් හී ලීන්ඩ් ඉන් අ ලිටිල් ලෝව(ර්) ටු කිස් හ(ර්), හිස් ලිප්ස් බ්‍රෂ්ඩ් අ මෝ(ර්) සෙන්සිටිව් ස්පොට්,  ද සයිඩ් ඔෆ් හ(ර්) නෙක්, ජස්ට් බිලෝ හ(ර්) ඉය(ර්). නීද(ර්) ඔෆ් දම් මූව්ඩ් ෆෝ  අ සෙකන්ඩ්. ඇන්ඩ් සම්වෙයා ඩීප් ඉන්සයිඩ් හිම්, හී නිව්  දැට් මෝමන්ට් වුඩ් රිමේන් විත් හිම් ෆෝ  එව(ර්).

ඔහු ඇයව සිපගැනීමට ටිකක් පහළට නැමුණු විට, ඔහුගේ තොල් වඩාත් සංවේදී ස්ථානයක , ඇගේ කනට මදක් පහළින්  ගෙලේ පැත්තක මෘදුව ස්පර්ශ විය. ඔවුන් දෙදෙනාම මොහොතක්  නොසෙල්වී සිටියහ. ඔහුගේ හදවතේ ගැඹුරුම  කොනක  ඒ මොහොත ඔහු සමඟ සදාකාලයටම රැඳී සිටින බව ඔහු දැනසිටියේය (lean -ලීන් - නැඹුරු වෙනවා )

**Language Focus**

- අපි මුලින්ම මේ වාක්‍යය බලමු . මෙහි before replying කියන කොටසට තමයි අපේ අවධානය යොමු වෙන්නේ

He stared at the screen for several seconds before replying
හී ස්ටෙයාඩ් ඇට් ද ස්ක්‍රීන් ෆෝ  සේවරල් සෙකන්ඩ්ස් බිෆෝ රිප්ලයිං.
පිළිතුරු දීමට පෙර ඔහු තත්පර කිහිපයක් තිරය දෙස බලා සිටියේය.

- before කියන වචනය එක්ක මේ වගේ ක්‍රියා පදයක ing රූපය යෙදෙන්න පුළුවන් . එවිට ඉන් අදහස් වෙන්නේ ඒ ක්‍රියාව වීමට පෙර කියන එක

They checked the tickets before entering the cinema.
දේ චෙක්ඩ් ද ටිකට්ස් බිෆෝ(ර්) එන්ටරිං ද සිනමා.
ඔවුන් සිනමා ශාලාවට ඇතුළු වීමට පෙර ටිකට් පත් පරීක්ෂා කලා.

I always drink a glass of water before going to bed.
අයි ඕල්වේස් ඩ්‍රිංක් අ ග්ලාස් ඔෆ් වෝට(ර්) බිෆෝ(ර්) ගොයිං ටු බෙඩ්.
මම නිතරම නිදා ගැනීමට පෙර වතුර වීදුරුවක් බොනවා.

She read the instructions carefully before starting the exam.
ෂී රෙඩ් ද ඉන්ස්ට්‍රක්ෂන්ස් කෙයාෆුලි බිෆෝ(ර්) ස්ටා(ර්)ටිං දි ඉග්සෑම්.
ඇය විභාගය ආරම්භ කිරීමට පෙර උපදෙස් හොඳින් කියවූවා.

He locked all the doors and windows before going out.
හී ලොක්ඩ් ඕල් ද ඩෝ(ර්)ස් ඇන්ඩ් වින්ඩෝස් බිෆෝ(ර්) ගොයිං අවුට්.
ඔහු පිටතට යාමට පෙර සියලු දොරවල් සහ ජනෙල් අගුළු දැම්මා.

She looked both ways before crossing the road.
ෂී ලුක්ඩ් බෝත් වේස් බිෆෝ ක්‍රොසිං ද රෝඩ්.
ඇය පාර පාර මාරු වීමට පෙර දෙපසම බැලුවාය.

- මීළඟට මේ වාක්‍යය

At that time, he had been working for a travel company
හී හැඩ් බීන් ව(ර්)කිං ෆෝ අ ට්‍රැවල් කම්පනි
ඒ කාලයේ ඔහු සංචාරක සමාගමක සේවය කරමින් සිටියේය

මෙය අතීත කාලයේ වාක්‍යයක් . මෙහි වර්තමාන කාලය අපි ඉගෙන ගත්තා මීට කලින් පාඩමකදී . මේ ඒ පාඩමේදී අපිට ලැබුණු උදාහරණ වාක්‍යය දෙකක්

She has been growing flowers since her childhood
ඇය ඇගේ කුඩා කාලේ ඉදලම මල් වවල තියෙනවා

We have been trying to solve this problem
අපි උත්සහා කරමින් ඉන්නේ මේ ප්‍රශ්නේ විසදන්න

- මෙහිදී කියන්නේ යම් කාලයක් තිස්සේ මේ දක්වාත් සිදුවෙමින් පවතින ක්‍රියාවන් . අපිට මේ පාඩමේදී ඉහත හමුවුණු වාක්‍යය මෙහි අතීත කාලය . ඒ කියන්නේ අතීත කාලයේ යම් අවස්ථාවක් වනවිට ඊට කලින් පටන් අරගෙන ඒ වනවිටත් සිදුවෙමින් පවතින ක්‍රියා

At that time, he had been working for a travel company
හී හැඩ් බීන් ව(ර්)කිං ෆෝ අ ට්‍රැවල් කම්පනි
ඒ කාලයේ ඔහු සංචාරක සමාගමක සේවය කරමින් සිටියේය

අපි තවත් ඒ වගේ උදාහරණ කීපයක් බලමු

They had been waiting there for a few hours
දේ හැඩ් බීන් වේටිං දෙයා ෆෝ අ ෆිව් අව(ර්)ස්
ඔවුන් එහි පැය කිහිපයක් තිස්සේ බලා සිට තිබුණා

She had been saving that money for her wedding.
ෂී හැඩ් බීන් සේවිං දැට් මනී ෆෝ හ(ර්) වෙඩිං
ඇය එම මුදල් ඇගේ විවාහය සඳහා ඉතිරි කරමින් සිට තිබුණා

He had been working in that company for five years.
හී හැඩ් බීන් ව(ර්)කිං ඉන් දැට් කම්පනි ෆෝ ෆයිව් ඉය(ර්)ස්.
ඔහු එම සමාගමේ වසර පහක් තිස්සේ වැඩ කරමින් සිට තිබුණා .

They had been talking on the phone for a long time.
දේ හැඩ් බීන් ටෝකිං ඔන් ද ෆෝන් ෆෝ අ ලෝං ටයිම්.
ඔවුන් දිගු වේලාවක් දුරකථනයෙන් කතා කරමින් සිට තිබුනා .

He had been living in Colombo for two decades before he moved abroad.
හී හැඩ් බීන් ලිවිං ඉන් කොළඹ ෆෝ ටූ ඩෙකේඩ්ස් බිෆෝ(ර්) හී මූව්ඩ් අබ්‍රෝඩ්.
ඔහු විදේශයට යාමට පෙර දශක දෙකක් තිස්සේ කොළඹ ජීවත් වී සිට තිබුණි.

They had been playing football all afternoon.
දේ හැඩ් බීන් ප්ලේයිං ෆුට්බෝල් ඕල් ආෆ්ට(ර්)නූන්.
ඔවුන් දහවල් පුරාම පාපන්දු ක්‍රීඩා කරමින් සිට තිබුණි.

She had been crying when he arrived.
ෂී හැඩ් බීන් ක්‍රයිං වෙන් හී අරයිව්ඩ්.
ඔහු පැමිණෙන විට ඇය අඬමින් සිට තිබුණා .

- මීළඟට මේ වාක්‍යය . අපි මෙතන අවධානය යොමු කරන්නේ without realizing කියන යෙදුමට

Without realizing it, she became part of his everyday life. And his feelings for her deepened beyond control. She knew it too.
විදවුට් රියලයිසිං ඉට්, ෂී බිකේම් පා(ර්)ට් ඔෆ් හිස් එව්රිඩේ ලයිෆ්
ඔහුට නොදැනීම, ඇය ඔහුගේ දෛනික ජීවිතයේ කොටසක් බවට පත් විය

- Without realizing කියන්නේ අවබෝධ කරගැනීමක් නොමැතිව . අපි තවත් උදාහරණ කීපයක් බලමු

Without realizing it, they became closer every day
විතවුට් රියලයිසිං ඉට්, දේ බිකේම් ක්ලෝස(ර්) එව්රි ඩේ
නොදැනීම, ඔවුන් සෑම දිනකම තව තවත් සමීප විය

Without realizing it, she had become his biggest support
විතවුට් රියලයිසිං ඉට්, ෂී හැඩ් බිකම් හිස් බිගස්ට් සපෝ(ර්)ට්
නොදැනීම, ඇය ඔහුගේ විශාලතම ආධාරය බවට පත් විය

Without realizing it, they had already fallen in love
විතවුට් රියලයිසිං ඉට්, දේ හැඩ් ඕල්රෙඩි ෆෝලන් ඉන් ලව්
නොදැනීම, ඔවුන් ඒ වන විටත් ආදරයෙන් බැඳී තිබුණි

Without realizing it, they came very close to a death trap
විතවුට් රියලයිසිං ඉට්, දේ කේම් වෙරි ක්ලෝස් ටු අ ඩෙත් ට්‍රැප්
නොදැනීම, ඔවුන් මර උගුලකට ඉතා ආසන්නයට පැමිනුණි

Without realizing it, he was getting into a lot of trouble
විතවුට් රියලයිසිං ඉට්, හී වෝස් ගෙටිං ඉන්ටු අ ලොට් ඔෆ් ට්‍රබල්
ඔහුටත් නොදැනීම, ඔහු බොහෝ කරදර වලට වැටෙමින් සිටියා

He was losing his money without realizing it
හී වෝස් ලූසිං හිස් මනී විතවුට් රියලයිසිං ඉට්
නොදැනීම, ඔහු තම මුදල් අහිමි කරමින් සිටියා

- මීළඟට මේ වාක්‍යය

When I first started talking to you, I was already in a relationship
වෙන් අයි ෆස්ට් ස්ටා(ර්)ටඩ් ටෝකින් ටු යූ, අයි වෝස් ඕල්රෙඩි ඉන් අ රිලේෂන්ෂිප්
මං මුලින්ම ඔයා එක්ක කතා කරන්න පටන් ගන්නකොටත් මං වෙන කෙනෙක් එක්ක සම්බන්ධතාවයක හිටියේ

- Already කියන වචනේ තේරුම "දැනටමත් " කියන එක , නමුත් මේක අතීත කාලයේ යෙදුනම එවිට අර්ථය එන්නේ " ඒ වෙනකොටත් " කියන එක

I had already finished my work when he called me.
අයි හැඩ් ඕල්රෙඩි ෆිනිෂ්ඩ් මයි ව(ර්)ක් වෙන් හී කෝල්ඩ් මී.
ඔහු මට කතා කරන කොට මම ඒ වෙනකොටත් මගේ වැඩ අවසන් කර තිබුණා .

She had already left the office before I arrived.
ෂී හැඩ් ඕල්රෙඩි ලෙෆ්ට් ද ඔෆිස් බිෆෝ(ර්) අයි අරයිව්ඩ්.
මම එන්න පෙර ඇය ඒ වෙනකොටත් කාර්යාලයෙන් පිටව ගොස් තිබුනා

They had already eaten dinner when we reached there.
දේ හැඩ් ඕල්රෙඩි ඊටන් ඩින(ර්) වෙන් වී රීච්ඩ් දෙයා.
අපි එහි යන විට ඔවුන් ඒ වන විටත් රාත්‍රී ආහාරය ගෙන තිබුණි.

He had already seen that movie before.
හී හැඩ් ඕල්රෙඩි සීන් දැට් මූවි බිෆෝ(ර්).
ඔහු ඒ වනවිටත් ඒ චිත්‍රපටය මීට පෙර දැක තිබුණා .

I had already told him the truth.
අයි හැඩ් ඕල්රෙඩි ටෝල්ඩ් හිම් ද ට්‍රූත්.
මම ඒ වෙනකොටත් ඔහුට සත්‍යය කියා තිබුණා .

She had already made a decision when I spoke to her.
ෂී හැඩ් ඕල්රෙඩි මේඩ් අ ඩිසිෂන් වෙන් අයි ස්පෝක් ටු හ(ර්).
මම ඇයට කතා කරන විට ඇය ඒ වනවිටත් තීරණයක් ගෙන තිබුණා .

- මේ ඊළඟ වාක්‍යය . මේ යමක් නොකිරීමට තීරණය කරන ආකාරය ප්‍රකාශ කරන විදිය

So he decided not to interrupt her.
සෝ හී ඩිසයිඩඩ් නොට් ටු ඉන්ටරප්ට් හ(ර්)
ඔහු ඇයට බාධා නොකිරීමට තීරණය කළේය

මේ එවැනි තවත් වාක්‍යය කිහිපයක්

I decided not to go there
අයි ඩිසයිඩඩ් නොට් ටු ගෝ දෙයා
මම එහි නො යාමට තීරණය කලා

She decided not to talk to him again
ෂී ඩිසයිඩඩ් නොට් ටු ටෝක් ටු හිම් අගේන්
ඇය ඔහු සමඟ නැවත කතා නොකිරීමට තීරණය කළා

They decided not to sell their house
දේ ඩිසයිඩඩ් නොට් ටු සෙල් දෙය(ර්) හවුස්
ඔවුන් තම නිවස නො විකිණීමට තීරණය කලා

We decided not to start the journey
වී ඩිසයිඩඩ් නොට් ටු ස්ටා(ර්)ට් ද ජ(ර්)නි
අපි ගමන ආරම්භ නොකිරීමට තීරණය කළා

- ඊළඟට මේ වාක්‍යය

So  he decided not to interrupt her. Instead, he sent her a message.
සෝ හී ඩිසයිඩඩ් නොට් ටු ඉන්ටරප්ට් හ(ර්). ඉන්ස්ටෙඩ්, හී සෙන්ට් හ(ර්) අ මෙසේජ්.
ඒ නිසා ඔහු ඇයට බාධා නොකිරීමට තීරණය කළා . ඒ වෙනුවට ඔහු ඇයට පණිවිඩයක් යැව්වා

- Instead කියන්නේ ඒ වෙනුවට කියන එක . මේ තවත් උදාහරණ වාක්‍යය

He didn’t argue with her. Instead, he stayed silent and walked away.
හී ඩිඩින්ට් ආගියු  විත් හ(ර්). ඉන්ස්ටෙඩ්, හී ස්ටේඩ් සයිලන්ට් ඇන්ඩ් වෝක්ඩ් අවේ.
ඔහු ඇය සමඟ වාද නොකළේය. ඒ වෙනුවට, ඔහු නිහඬව සිට  ඉවත්ව ගියේය.

She didn’t go home. Instead, she stayed at her friend’s house.
ෂී ඩිඩින්ට් ගෝ හෝම්. ඉන්ස්ටෙඩ්, ෂී ස්ටේඩ් ඇට් හ(ර්) ෆ්‍රෙන්ඩ්ස් හවුස්.
ඇය ගෙදර ගියේ නැත. ඒ වෙනුවට, ඇය තම මිතුරියගේ නිවසේ සිටියාය.

He didn’t reply immediately. Instead, he thought for a long time.
හී ඩිඩ්න්ට් රිප්ලයි ඉමීඩියේට්ලි. ඉන්ස්ටෙඩ්, හී තෝට් ෆෝ  අ ලෝං ටයිම්.
ඔහු වහාම පිළිතුරු දුන්නේ නැත. ඒ වෙනුවට, ඔහු දිගු වේලාවක් සිතා බැලීය.

They didn’t take a taxi. Instead, they walked to the station.
දේ ඩිඩ්න්ට් ටේක් අ ටැක්සි. ඉන්ස්ටෙඩ්, දේ වෝක්ඩ් ටු ද ස්ටේෂන්.
ඔවුන් ටැක්සියක් ගත්තේ නැත. ඒ වෙනුවට, ඔවුන් ස්ටේෂමට  ඇවිද ගියහ.

She didn’t cry. Instead, she smiled through her pain.
ෂී ඩිඩ්න්ට් ක්‍රයි. ඉන්ස්ටෙඩ්, ෂී ස්මයිල්ඩ් තෲ හ(ර්) පේන්.
ඇය ඇඬුවේ නැත. ඒ වෙනුවට, ඇය තම වේදනාව අතරින් සිනාසුණාය.

We didn’t give up. Instead, we tried harder.
වී ඩිඩ්න්ට් ගිව් අප්. ඉන්ස්ටෙඩ්, වී ට්‍රයිඩ් හාඩ(ර්).
අපි අත්හැරියේ නැත. ඒ වෙනුවට, අපි තවත් උත්සාහ කළෙමු.

- ඊළඟට මේ වාක්‍යය .

Even before turning around, he knew it was her.
ඊවන් බිෆෝ(ර්) ට(ර්)නිං අරවුන්ඩ්, හී නිව්  ඉට් වෝස් හ(ර්)
පිටුපස හැරීමටත් පෙර, ඒ ඇය බව ඔහු දැනගත්තේය

- අපි මේ පාඩමේ Language focus එකේ මුලින්ම ඉගෙන ගත්තා before + ……ing කියන යෙදුම . එවිට එහි තේරුම එන්නේ ඒ ක්‍රියාව “කරන්න කලින්” කියන එක
  නමුත් even  before ….ing ලෙස ආවොත් ඉන් අදහස් වෙන්නේ ඒ ක්‍රියාව “ කරන්නත් කලින් “ කියන එක

Even before speaking, she understood his feelings.
ඊවන් බිෆෝ(ර්) ස්පීකිං, ෂී අන්ඩ(ර්)ස්ටුඩ්   හිස් ෆීලිංග්ස්.
කතා කිරීමටත් පෙර, ඇය ඔහුගේ හැඟීම් තේරුම් ගත්තා.

Even before opening the letter, she started crying.
ඊවන් බිෆෝ ඕපනිං ද ලෙට(ර්), ෂී ස්ටා(ර්)ටඩ් ක්‍රයිං.
ලිපිය විවෘත කිරීමටත් පෙරම , ඇය අඬන්න පටන් ගත්තා

Even before entering the room, he heard their voices.
ඊවන් බිෆෝ එන්ටරිං ද රූම්, හී හ(ර්)ඩ් දෙයා  වොයිසස්.
කාමරයට ඇතුළු වීමටත් පෙරම , ඔහුට  ඔවුන්ගේ හඬ ඇසුනා .

Even before checking the result, he knew he had failed.
ඊවන් බිෆෝ චෙකිං ද රිසල්ට්, හී නිව්  හී හැඩ් ෆේල්ඩ්.
ප්‍රතිඵලය පරීක්ෂා කිරීමටත් පෙරම , ඔහු අසමත් වූ බව ඔහු දැනගත්තේය.

Even before stepping inside, he felt nervous.
ඊවන් බිෆෝ ස්ටෙපිං ඉන්සයිඩ්, හී ෆෙල්ට් න(ර්)වස්.
ඇතුළට පා තැබීමටත් පෙරම, ඔහුට  නොසන්සුන් බවක් දැනුණි.

- මේ අවසන් වාක්‍යය

Just before reaching the road, she suddenly stopped.
ජස්ට් බිෆෝ(ර්) රීචිං ද රෝඩ්, ෂී සඩ්න්ලි ස්ටොප්ට්.
පාරට ළඟාවීමට මොහොතකට පෙර, ඇය හදිසියේම නතර වූවාය.

- Just before යෙදුනම අර before වලින් එන අර්ථයට  තවත් ඉක්මන් බවක් එනවා . "ඒ ක්‍රියාව සිදුවෙන්ට මොහොතකට පෙර"  කියන තේරුම එනවා

Just before the rain started, they reached home.
ජස්ට් බිෆෝ ද රේන් ස්ටා(ර්)ටඩ්, දේ රීච්ඩ් හෝම්.
වැසි ඇරඹීමට මොහොතකට පෙර, ඔවුන් ගෙදරට පැමිණිය

Just before he spoke, the room became completely silent.
ජස්ට් බිෆෝ හී ස්පෝක්, ද රූම් බිකේම් කම්ප්ලීට්ලි සයිලන්ට්.
ඔහු කතා කිරීමටත් මොහොතකට පෙර, කාමරය සම්පූර්ණයෙන් නිහඬ විය.

Just before the train left, she arrived at the platform.
ජස්ට් බිෆෝ ද ට්‍රේන් ලෙෆ්ට්, ෂී අරයිව්ඩ් ඇට් ද ප්ලැට්ෆෝම්.
දුම්රිය පිටව යාමටත් මොහොතකට පෙර, ඇය වේදිකාවට පැමිණියාය.

Just before he opened the door, he heard a strange noise inside .
ජස්ට් බිෆෝ හී ඕපන්ඩ් ද ඩෝ, හී හ(ර්)ඩ් අ ස්ට්‍රේන්ජ් නොයිස් ඉන්සයිඩ් .
ඔහු දොර විවෘත කිරීමට මොහොතකට පෙර, ඔහුට ඇතුලේ අමුතු ශබ්දයක් ඇසුණි.

Just before the meeting ended, she asked one final question.
ජස්ට් බිෆෝ ද මීටිං එන්ඩඩ්, ෂී ආස්ක්ට් වන් ෆයිනල් ක්වෙස්ෂන්.
රැස්වීම අවසන් වීමට මොහොතකට පෙර, ඇය අවසන් ප්‍රශ්නයක් ඇසුවා.

Just before he fell asleep, he thought about her.
ජස්ට් බිෆෝ හී ෆෙල් ඇස්ලීප්, හී තෝට් අබවුට් හ(ර්).
නිදා ගැනීමට මොහොතකට පෙර, ඔහු ඇය ගැන සිතුවා

**Vocabulary** 70

Appear – අපියර්(ර්) – පෙනී සිටිනවා, දිස්වනවා

Sunset – සන්සෙට් – හිරු බැස යෑම

Sunrise – සන්රයිස් – හිරු උදාව

Stare – ස්ටෙයා – එක එල්ලේ බලා සිටිනවා , රවා බලා සිටිනවා

Lean back – ලීන් බැක් – පිටුපසට හේත්තු වෙනවා

Fly – ෆ්ලයි – පියාසර කරනවා

Flew – ෆ්ලූ – පියාසර කළා

Flown – ෆ්ලෝන් – පියාසර කර ඇති

Strange – ස්ට්‍රේන්ජ් – අමුතු, අසාමාන්‍ය

Strangely – ස්ට්‍රේන්ජ්ලි – අමුතු ලෙස

Unforgettable – අන්ෆොගෙටබල් – අමතක නොවන

Approach – අප්‍රෝච් – ළඟා වෙනවා / ලඟා වීම , ප්‍රවේශය

Brief – බ්‍රීෆ් – කෙටි, සංක්ෂිප්ත

Lower – ලෝව(ර්) – පහත් කරනවා / පහළ

Mutual – මියුචුවල් – අන්‍යෝන්‍ය

Unexpectedly – අන්එක්ස්පෙක්ටඩ්ලි – අනපේක්ෂිත ලෙස

Reopen – රීඕපන් – නැවත විවෘත කරනවා

Casually – කැෂුවලි – සැහැල්ලුවෙන්

Constantly – කොන්ස්ටන්ට්ලි – නිරන්තරයෙන්

Endless – එන්ඩ්ලස් – නිමක් නැති

Endlessly – එන්ඩ්ලස්ලි – නිමක් නැතිව

Details – ඩීටේල්ස් – විස්තර

Random – රැන්ඩම් – අහඹු

Deepen – ඩීපන් – ගැඹුරු කරනවා

Beyond – බියොන්ඩ් – ඉක්මවා, එහා

Control – කන්ට්‍රෝල් – පාලනය / පාලනය කරනවා

Beyond control - බියොන්ඩ් කොන්ට්‍රෝල් - පාලනයක් නැතිව

Obvious – ඔබ්වියස් – පැහැදිලි

Obviously - ඔබ්වියස්ලි - පැහැදිලිවම

Affection – අෆෙක්ෂන් – සෙනෙහස, ආදරය

Beneath – බිනීත් – යටින්, පහළින්

Confess – කන්ෆෙස් – පිළිගන්නවා, පාපෝච්චාරණය කරනවා

Romance – රොමෑන්ස් – ප්‍රේමය

Hint – හින්ට් – ඉඟිය , ඉඟි කරනවා

Purpose – ප(ර්)පස් – අරමුණ

Shatter – ෂැට(ර්) – කැබලිවලට කැඩෙනවා , බිඳ දමනවා

Certain – ස(ර්)ටින් – නිශ්චිත, නිශ්චිත

Uncertain – අන්ස(ර්)ටින් – අවිනිශ්චිත

Chest – චෙස්ට් – පපුව

Tighten – ටයිටන් – තද කරනවා

Painfully – පේන්ෆුලි – වේදනාකාරී ලෙස

Force – ෆෝ(ර්)ස් – බලය / බල කරනවා

Calmly – කාම්ලි – සන්සුන්ව

Completely – කම්ප්ලීට්ලි – සම්පූර්ණයෙන්ම

Sense – සෙන්ස් – දැනෙනවා

Tiny – ටයිනි – ඉතා කුඩා

Continue – කන්ටිනියු – දිගටම කරගෙන යනවා

Burn – බ(ර්)න් – දහනය වෙනවා, පිළිස්සෙනවා

Festival – ෆෙස්ටිවල් – උත්සවය

Overflow – ඕව(ර්)ෆ්ලෝ – උතුරා යනවා, පිටාර ගලනවා

Performance – ප(ර්)ෆෝමන්ස් – ප්‍රසංගය, කාර්ය සාධනය

Heartbeat – හාට්බීට් – හෘද ස්පන්දනය

Quicken – ක්විකන් – වේගවත් කරනවා

Quietly – ක්වයට්ලි – නිහඬව

Tent – ටෙන්ට් – කූඩාරම

Scan – ස්කෑන් – පරීක්ෂා කරනවා, ස්කෑන් කරනවා

Audience – ඕඩියන්ස් – ප්‍රේක්ෂකයින්

Absorb – ඇබ්සෝ(ර්)බ් – උරාගන්නවා, අවශෝෂණය කරනවා

Interrupt – ඉන්ටරප්ට් – බාධා කරනවා

Instead – ඉන්ස්ටෙඩ් – ඒ වෙනුවට

Toward – ටුවෝඩ් – දෙසට

Gently – ජෙන්ට්ලි – මෘදු ලෙස

Warmth – වෝම්ත් – උණුසුම

Glow – ග්ලෝ – දිලිසෙන ආලෝකය / දිලිසෙනවා

Softly – සොෆ්ට්ලි – මෘදු ලෙස

Energy – එන(ර්)ජි – ශක්තිය

Energetic – එන(ර්)ජෙටික් – ශක්තිමත්, ජවයෙන් පිරී

Outspoken – අවුට්ස්පෝකන් – කෙළින් කතා කරන

Tender – ටෙන්ඩ(ර්) – මෘදු

Tenderness – ටෙන්ඩ(ර්)නස් – මෘදු බව

Soft – සොෆ්ට් – මෘදු

Softness – සොෆ්ට්නස් – මෘදු බව

Lift – ලිෆ්ට් – ඔසවනවා / සෝපානය

Newly – නිව්ලි – අලුතින්

Exit – එක්සිට් – පිටවීම / පිටවෙනවා

Carnival – කානිවල් – සැණකෙළිය

Heartbreak – හාට්බ්‍රේක් – හිත් බිඳුම

Apartment – අපාට්මන්ට් – නිවාස ඒකකය

Nervousness – න(ර්)වස්නස් – චකිතය, නොසන්සුන්තාව

Await – අවේට් – බලාපොරොත්තුවෙන් සිටිනවා

Final – ෆයිනල් – අවසාන

Judgement – ජජ්මන්ට් – විනිශ්චය, තීරණය

Cheerful – චිය(ර්)ෆුල් – සතුටින් සිටින

Cheerfully – චිය(ර්)ෆුලි – සතුටින්

Suffer – සෆ(ර්) – දුක් විඳිනවා

Suffering – සෆරිං – දුක් විඳීම

Exhaustion – එග්සෝස්චන් – දැඩි වෙහෙස

Financial – ෆයිනෑන්ෂල් – මූල්‍යමය

Struggle – ස්ට්‍රගල් – අරගලය / අරගල කරනවා

Imagine – ඉමැජින් – සිතින් මවා ගන්නවා

Stable – ස්ටේබල් – ස්ථාවර

Dependable – ඩිපෙන්ඩබල් – මත රැඳිය හැකි

Security – සිකියුරිටි – ආරක්ෂාව

Reject – රිජෙක්ට් – ප්‍රතික්ෂේප කරනවා

Matter – මැට(ර්) – කාරණය / වැදගත් වෙනවා

Regret – රිග්‍රෙට් – පසුතැවීම / පසුතැවෙනවා

Silence – සයිලන්ස් – නිහඬතාව

Ache – ඒක් – වේදනාව / රිදෙනවා

Aching – ඒකින් – වේදනාකාරී

Glisten – ග්ලිසන් – දිලිසෙනවා

Whisper – විස්ප(ර්) – කොඳුරනවා

Embrace – එම්බ්‍රේස් – වැළඳ ගන්නවා

Tightly – ටයිට්ලි – තදින්

Spot – ස්පොට් – ස්ථානය

Neither – නයිද(ර්) – එකක්වත් නැත

Forever – ෆෝරෙව(ර්) – සදාකාලිකව, සදහටම